**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #June24**

ඓේදවාචකයක් වාර්තා කරනා පහත දැක්වෙන දිවයින ලිපිය මගින්, එය වඩාත් නාට්‍යානුසාරීව නැතිනම් කතාන්තරයක් කියන්නා වූ ආකාරයකින් පාඨකයා වෙත ඉදිරිපත් කොට ඇත. එහිදී තරුණියගේ රූමත්කමද මාධ්‍යවේදියා විසින් පුන පුනා වර්ණනා කරයි. ඇතැම් විට එයට හේතුව ඔහු විසින් පවසනා 'කතාන්දරයේ' ජීව ගුණය නැංවීම හෝ සිදුවීම් දාමයේ අවසානය වඩාත් තීව්‍ර කිරීම විය හැක. ඒ නිසාවෙන්ම එම කාන්තා වර්ණනයන් මෙම 'කතාන්තරයට' අවශ්‍ය යැයිද අයෙකු තර්ක කළ හැක.

අපට අසන්නට ඇත්තේ මෙපමණකි. ජනමාධ්‍ය තුළින් සිදුවිය යුත්තේ කතාන්තර කීමද නැතිනම් වාර්තාකරණයද? ප්‍රමුඛ විය යුත්තේ වාර්තාකරණය නම්, කාන්තාවගේ බාහිර ස්වරූපය වර්ණනා කිරීම සහ ඇයව ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීම මාධ්‍ය ආචාර ධාර්මිකව කෙතරම් උචිතද?